1st Place Winner
National Productivity
Award 2020

SLSI
SYSTEM ISO 9001 CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/2/14/Common | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.12. 05 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්,ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CS/SLAS/ANN.TRA/2023 , MPA/PSD/C6/AT – 2023 , MpubAd/AcSD/Ann. Transfers -2023 හා 2022.11.25 දිනැති ලිපි හා බැඳේ.

02. එමඟින්, පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නිකුත් කර ඇත.

- ශ්‍රී ලංකා පරිපාලන සේවය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2022
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2022
- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2022

03. ඒ අනුව ස්ථාන මාරු කිරීම් සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් එම ක්‍රියා පටිපාටියේ දක්වා ඇති ආකාරයට අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව එහි සඳහන් අවසන් දිනට පෙර ඉදිරිපත් කල යුතුය.

04. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අනිවාර්යයෙන් යටත් වන නිලධාරීන්ගේ තොරතුරු ආයතන ප්‍රධානියා විසින් ඇමුණුම III අනුව ඉදිරිපත් කල යුතුය.

05. ඒ අනුව ඉහත සඳහන් චක්‍රලේඛ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2022

මගේ අංකය : MpubAd/AcSD/Ann. Transfers -2023
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2022.11.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023 (I, II හා III ශ්‍රේණි)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන ස්ථානමාරු පටිපාටිය පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් වූ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

### 01. වාර්ෂික ස්ථාන මාරු කමිටුව පත් කිරීම හා එහි ක්‍රියාවලිය

ස්ථාන මාරු පටිපාටියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ 2023 වර්ෂයට අදාළව ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුව මෙම අමාත්‍යාංශය මඟින් පත් කරනු ලැබේ. මෙම කමිටුවේ කාර්යභාරය වනුයේ ස්ථාන මාරු අපේක්ෂිත නිලධරයන්ගේ ඉල්ලීම් සලකා බැලීම, නිලධරයන් වෙත සාධාරණ කාල පරාසයන් තුල ස්ථාන මාරුවීම් ක්‍රමානුකූලව ලබා දීම සහ එකම සේවා ස්ථානයක නිලධරයන් දීර්ඝ කාලයක් තිස්සේ රැඳී සිටීම වැලැක්වීම පිණිස ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය යොදවා ගැනීම වේ.

**02. ස්ථාන මාරුවීම් කමිටුවේ සංයුතිය**

මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විතව ස්ථාන මාරු කමිටුව පත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I. මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සභාපති |
| II. අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය) | - | සාමාජික |
| III. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන, ස්වදේශ කටයුතු අංශය) | - | සාමාජික |
| IV. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමයේ නියෝජිතයෙක් | - | සාමාජික |

**03. වාර්ෂික ස්ථාන මාරු කමිටු යෝජනාවලට එරෙහිව කරුණු දැක්වීමේ අවස්ථාව**

ඉහත සඳහන් ස්ථාන මාරු කමිටුව මඟින් ගනු ලබන යෝජනා පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී යෝජනා සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයන් වෙත අවස්ථාවක් ලබා දෙනු ලබන අතර එම නිලධාරීන් ලිඛිතව තම අභියාචනය මෙහි 9.3 හි සඳහන් ලිපිනයට ස්ථාන මාරු කමිටුව විසින් දන්වනු ලබන යෝජනාවල සඳහන් දිනට පෙර එවිය යුතු ය. ඉන් අනතුරුව එම කරුණු දැක්වීම් පහත සඳහන් කමිටුව මඟින් සමාලෝචනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I. මෙම අමාත්‍යාංශයේ ලේකම් | - | සභාපති |
| II. වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙකු | - | සාමාජික |
| III. අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සාමාජික |

මේ යටතේ නිලධරයන්ට ස්ථාන මාරු කිරීම්වලට එරෙහිව කරුණු ඉදිරිපත් කළ හැක්කේ පහත අවස්ථාවන්හි පමණි.

I. මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි මාරුවීම් කර ඇති අවස්ථාවල
II. නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථාවල
III. නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස මාරුවීම් කරන ලද අවස්ථාවල

**04. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අනිවාර්යයෙන් යටත් වන නිලධරයන්**

මෙම ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I/ II/ III ශ්‍රේණියේ පහත සඳහන් නිලධරයන් අනිවාර්යයෙන් යටත් වනු ලැබේ.

I. එකම සේවා ස්ථානයක වසර 06 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කරන නිලධරයන්
II. එක් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ පළාත් සභාවක හෝ මුළු සේවා කාලය උපරිම වසර 12ක් සම්පූර්ණ කර ඇති නිලධරයන්

III. කොළඹ දිස්ත්‍රික්කය හැර අනෙකුත් දිස්ත්‍රික්ක අතුරින් එක් දිස්ත්‍රික්කයක් තුල පිහිටි අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හෝ පළාත් සභා කාර්යාලයක හෝ මුළු සේවා කාලය වසර දොළහ (12) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන්

IV. මෙහි "අංක 06 "හි සඳහන් ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 03 ක් වන උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන්

**05. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ අනිවාර්ය ගණයට නොගැනෙන ස්ථාන මාරුවීම්**

මෙම ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය යටතේ ඉහත සඳහන් පරිදි අනිවාර්යයෙන්ම කරනු ලබන ස්ථාන මාරුවීම් වලට අමතරව මෙම ක්‍රියාවලිය තුළින් ස්ථාන මාරුවීම් ලබා ගැනීමට බලාපොරොත්තු වන අනෙකුත් නිලධාරීන්ටද ඉල්ලුම් කළ හැකි ය. කෙසේ නමුදු මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බලනුයේ ඔවුන් සාධාරණ සේවා කාලයක් වර්තමාන සේවා ස්ථානයේ සේවය කර ඇත්නම් පමණි. ඒ පිළිබඳ අවසන් තීරණය ස්ථාන මාරු කමිටුවේ තීරණය වන අතර එම ඉල්ලීම් පිළිබඳව ස්ථාන මාරු කමිටුව විසින් දන්වනු ලබන ස්ථාන මාරු යෝජනාවල දක්වා ඇති නියමිත දිනට පෙර කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි ය.

**06. ප්‍රියමනාප සේවා ස්ථාන වර්ගීකරණය**

විවිධ සේවා ස්ථාන වල ගෙවනු ලබන නිත්‍යානුකූල අතිරේක මූල්‍යමය ප්‍රතිලාභ අනුව පහත සඳහන් ආයතන ප්‍රියමනාප සේවා ස්ථාන වශයෙන් මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය තුළ සලකනු ලබන අතර එම සේවා ස්ථාන වල සේවය කළ හැකි උපරිම සේවා කාලය වසර 03 කි. එකී සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙහි "අංක 04 (IV)"ට අනුකූලව අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කිරීම් වලට සුදුසුකම් ලබා ඇතැයි සලකා කටයුතු කරනු ලැබේ.

1. රේගු දෙපාර්තමේන්තුව
2. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
3. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
4. සුරාබදු දෙපාර්තමේන්තුව
5. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
6. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
7. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

<u>එම සේවා ස්ථානවල දැනට පවත්නා හා ඉදිරියේදී ඇතිවිය හැකි පුරප්පාඩු</u>

| දෙපාර්තමේන්තුව | දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව | | 2022.12.31 දිනට ඇතිවිය හැකි පුරප්පාඩු සංඛ්‍යාව | | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා ඇතිවිය හැකි පුරප්පාඩු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | I ශ්‍රේණිය | II/III ශ්‍රේණිය | I ශ්‍රේණිය | II/III ශ්‍රේණිය | I ශ්‍රේණිය | II/III ශ්‍රේණිය |
| රේගු දෙපාර්තමේන්තුව | - | - | - | - | - | - |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | - | - | - | - | - | - |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - | - | 01 | - | - | - |
| සුරාබදු දෙපාර්තමේන්තුව | - | - | - | - | - | - |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | - | - | - | - | - | - |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - | - | - | - | - |
| වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | - | 01 | - | - | - |

සටහන:

*(i) සාමාන්‍ය තත්ත්වය යටතේ ඕනෑම නිලධරයෙකුට තම මුළු සේවා කාලය තුළ ඉහත සඳහන් දෙපාර්තමේන්තු අතුරින් එක් ස්ථානයක පමණක් සේවය කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.*

*(ii) මෙම සේවා ස්ථාන සඳහා කරනු ලබන ස්ථානමාරු ඉල්ලීම් නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව වැඩි ජ්‍යෙෂ්ඨත්වයක් ඇති නිලධරයන්ට ප්‍රමුඛත්වය ලැබෙන අයුරින් ඉටුකෙරේ*

**07. වාර්ෂික ස්ථාන මාරු වීම් වලට යටත් නොවන ආයතන**

පහත සඳහන් ආයතනවල සේවය කරනු ලබන නිලධරයන්ගේ ස්ථාන මාරු එම ආයතනයන්ගේ ස්වභාවය සලකා මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ සලකා බලනු නොලැබේ.

I. ජනාධිපති කාර්යාලය
II. අග්‍රාමාත්‍ය කාර්යාලය
III. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
IV. සභානායක කාර්යාලය
V. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
VI. විපක්ෂ නායක ලේකම් කාර්යාලය

**08**. **ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය අනුව ස්ථාන මාරු වලට යටත් වන ආයතන**

පහත දැක්වෙන ආයතනවලට අදාලව වාර්ෂික ස්ථාන මාරු කමිටු මඟින් නිලධරයින් ස්ථාන මාරු කිරීමේ දී එම ආයතනවලින් පිටතට ස්ථාන මාරු කරනු ලබන හා එම ආයතනවලට ස්ථාන මාරු කරනු ලබන නිලධරයින් පිළිබඳව අදාළ ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව කටයුතු සිදු කරනු ලැබේ.

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
II. මැතිවරණ කොමිෂන් සභාව
III. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
IV. මුදල් කොමිෂන් සභාව
V. ජාතික වැටුප් කොමිෂන් සභාව
VI. සීමා නිර්ණය කොමිෂන් සභාව
VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ලෙස නියමයන් දක්වා ඇති ආයතන

**09. වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාවලියට අදාළ පොදු කරුණු**

9.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට හා වර්තමාන සේවා ස්ථානවල සේවය කළ හැකි උපරිම සේවා කාලයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

9.2 ඉහත සඳහන් පරිදී ස්ථාන මාරු කිරීම් වලට සුදුසුකම් ලබන නිලධාරීන් මෙම ක්‍රියා පටිපාටියේ දක්වා ඇති ආකාරයට අදාළව මෙහි "ඇමුණුම I"හි දක්වා ඇති අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව ඉල්ලුම් කළ යුතු ය.

9.3 එලෙසින් සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පත්‍රය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර එම ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ "ශ්‍රී ලං.ග.සේ. වාර්ෂික ස්ථාන මාරු - 2023" යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට යොමු කළ යුතු ය.

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

9.4 මෙම චක්‍රලේඛය යටතේ සඳහන් කර ඇති ආකාරයට අනිවාර්ය ස්ථාන මාරු කිරීම සඳහා යටත්වන නිලධරයන් ඒ සඳහා ඉහත වගන්තියේ සඳහන් ආකාරයට ඉල්ලුම්

නොකළද, ඔවුන් අනිවාර්ය ස්ථාන මාරු කිරීමට ස්ථාන මාරු කමිටුවට බලය හිමි වේ. එසේ ඉල්ලුම් කරනු නොලබන නිලධරයන් වෙත මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ නව සේවා ස්ථාන ලබා දීමේදී, නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන නිලධරයින් වෙත ප්‍රමුඛත්වය ලබා දීමෙන් අනතුරුව ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ඉතිරි පුරප්පාඩු සලකා බලා ස්ථාන මාරුවීම් ලබා දෙනු ඇත. **මෙහිදී නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන නිලධරයින් ඔවුන් ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථාන වල සේවය කිරීමට කැමැත්තක් දක්වන බවටත්, නිසි පරිදි ඉල්ලුම් නොකරනු ලබන නිලධරයන් දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති බවටත් සලකා කටයුතු කරනු ඇත.**

9.5 වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් ලබා දුන් යෝජනා සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයන් මෙහි "ඇමුණුම IV" හි ආකෘති පත්‍රය ප්‍රකාරව සිය කරුණු දැක්වීම ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත නියමිත කාලය තුළදී මෙහි "අංක 03" හි සඳහන් ආකාරයට ඉදිරිපත් කළ යුතු වේ.

9.6 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

I. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය අභියාචක විසින් "ඇමුණුම V " ට අනුකූලව ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව තොරතුරු මෙහි "ඇමුණුම VI " ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන අදාළ නිලධාරියා ක්‍රියා කළ යුතු වන්නේ ය.

II. රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ මෙම අමාත්‍යාංශයේ ලේකම් මඟින් පමණකි. අදාල නිලධාරීන් එම අභියාචනයේ පිටපත් තම වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතු වන්නේය. එලෙස යොමු කරනු ලබන අභියාචනා පිළිබඳව අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

III. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, එම ස්ථාන මාරු කිරීමේ නියෝග අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට **දින 14ක්** ඇතුළත මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. එලෙස නියමිත කාලය තුළදී ඉදිරිපත් නොකරන අභියාචනා පිළිබඳව සලකා නොලබනු ලබන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද ප්‍රතික්ෂේප කරනු ඇත.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ලේඛන හා වාර්තා ආදිය ද සමග ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින **15** ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය.

V. වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලබා දී තිබිය දී එම යෝජනාවන්ට එරෙහිව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කර නොමැති නිලධරයින්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු නොලැබේ.

VI. අදාළ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල සඳහන් විධිවිධාන අනුව, වාර්ෂික ස්ථාන මාරුවීමක් අයදුම් කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයින්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතු ය.

VII. මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලැබේ.

VIII. මෙහි "අංක 9.6 ( IV)" හි සඳහන් ලියවිලි ලැබී දින **15** ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය ගනු ලැබේ.

IX. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි මෙම අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලැබේ.

X. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත.

**10**. අදාළ ආකෘති පත්‍රවල මෘදු පිටපත් පහත දැක්වෙන පරිදි මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

| |
|---|
| www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය → බාගත කිරීම් |

**11**. **සේවා කාල ගණනය කිරීම**

වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා :- 2023 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2022.12.31 දිනට)

11.1 සේවා කාලය ගණනය කිරීමේදී එක් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

කෙසේ වුවද දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ. (උදා - ප්‍රසූත නිවාඩු, අධ්‍යයන නිවාඩු)

11.2 කිසියම් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

11.3 කිසියම් සේවා ස්ථානයක හෝ ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධාරීන් නියමිත සේවා කාලය සම්පූර්ණ නොකර සිටියද, ඔවුන් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේ ය.

11.4 යම් සේවා ස්ථානයක සේවය කළ කාලය ගණන් ගැනීමේ දී, වැටුප් රහිත නිවාඩු ලබා සිටි, වැටුප් සහිත විදේශ නිවාඩු ලබා සිටි, ව්‍යාපෘති සඳහා රජයේ අවශ්‍යතාවය හෝ නිලධරයන්ගේ ඉල්ලීම මත මුදා හැර ඇති හෝ ද්විතියික පදනම මත වෙනත් ආයතනවල සේවය සඳහා මුදා හැර සිටි කාල සීමාවන් ද ගණන් ගනු ලැබේ.

**12.** සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත. නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නැත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 58 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේ ය.

**13**. ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී (ඇමුණුම I පරිදි), ස්ථාන මාරු තීරණයන්ට අදාළ කරුණු දැක්වීමේදී (ඇමුණුම IV පරිදි) හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේදී (ඇමුණුම V පරිදි) සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

**14. ස්ථාන මාරු කිරීම් පිලිබඳ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම**

14.1 වාර්ෂික ස්ථාන මාරු වලට අනිවාර්යයෙන් යටත් වන නිලධාරීන් සහ ස්ථාන මාරු ඉල්ලීම් කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු අදාළ "ඇමුණුම II" පරිදි නිවැරදිව සම්පූර්ණ කර මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙහි "අංක 19" හි වගුවේ සඳහන් නියමිත දිනට පෙර එවීම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ/ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේද වගකීම වන්නේ ය.

14.2 ප්‍රියමනාප දෙපාර්තමේන්තු ලැයිස්තුවේ සඳහන් පරිදි අදාළ කාලයට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛනයක් (සියලු තොරතුරු අදාළ ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර) මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වනු ලබන දිනට පෙර එවීම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ/ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම වන්නේ ය.

14.3 සියලුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල වසර 06 කට වැඩි සහ වසර 12 කට වැඩි සේවා කාල සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ වාර්තාවක් මෙහි අංක 11 හි 11.1 සහ 11.2 උප වගන්ති වල දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවීමට දෙපාර්තමේන්තු ප්‍රධානින් හා අමාත්‍යාංශ ලේකම්වරුන් ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු වේ.

14.4 නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීම හේතුවෙන් ස්ථාන මාරු කිරීමට යටත් වන එහෙත් ස්ථාන මාරු අයදුම් කර නොමැති යම් නිලධරයෙකු සිටී නම්, ඔහු/ ඇය සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනීමට කිසියම් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට අවශ්‍ය නම්, වසර 06 ට වැඩි සේවා කාලය සහිත නිලධරයන්ගේ නිර්දේශ යොමු කරන අවස්ථාවේදී එවැනි නිලධරයෙකු රඳවා ගැනීමේ ඉල්ලීම ද ස්ථාන මාරු අයදුම්පත් යොමු කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු වේ.

14.5 සෑම නිලධරයකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානින් වග බලා ගත යුතුය. සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිදරව් වුවහොත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානින්, එම ලැයිස්තු සකස් කළ අය හා එහි නිවැරදි බව පරීක්ෂා කර බලා තහවුරු කරන ලද නිලධරයන් ඒ පිළිබඳව වගකීමට යටත් වේ.

14.6 වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අවසන් තීරණ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේත්, වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සම්බන්ධ අවසන් තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේත්, පළ කරනු ලබන අතර ඒ අනුව ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්ගේ ස්ථාන මාරු අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

14.7 ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදි නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති. නිලධරයෙකු වැඩ භාර ගැනීමෙන් පසු "ඇමුණුම VII" මඟින් ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව අදාළ සේවා ස්ථානයට දැන්විය යුතු ය.

14.8 ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරු පටිපාටියට පටහැනිය. පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා ස්ථාන මාරු නියෝග ලබන මධ්‍යම රජය යටතේ වන ආයතනයන්හි තනතුරුවල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයින්, අදාළ ස්ථාන මාරු නියෝග පරිදි නව සේවා ස්ථානවල සේවය සඳහා අනිවාර්යෙන්ම වාර්තා කළ යුතුය. එමෙන්ම, පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයින් තමා ලබන ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු වී යාමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සලසා ගත යුතු ය.

14.9 වාර්ෂික ස්ථානමාරු කමිටුව මඟින් අමාත්‍යාංශයෙන්/පළාත් සභාවලින්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කළ යුතු ය (ඇමුණුම VIII පරිදි).

14.10 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ

ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

14.11 එක් අමාත්‍යාංශයක/පළාත් සභා/දෙපාර්තමේන්තු වල ප්‍රධානින් 2023 මැයි 03 දිනට පෙර තම ආයතනයෙන් මුදා හරින ලද/නොලද සහ සේවයට වාර්තා කළ/නොකළ නිලධාරීන් පිළිබඳ විස්තර "ඇමුණුම IX හා X " අනුව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතු ය.

**15**. විශේෂ කොන්දේසි මත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවාගෙන ඇති නිලධරයන්ගේ ස්ථානමාරු මෙම පටිපාටිය යටතේ සලකා බැලිය හැක්කේ පත්වීම් ලිපිවල ඇතුළත් කොන්දේසි අනුව අදාල කාලය ඉකුත් වීමෙන් පසු පමණි. නමුත් සේවා අවශ්‍යතාවය හෝ වෙනත් විශේෂිත හේතු මත අදාල ප්‍රදේශ ඇතුළත ස්ථානමාරුවීම්/අනුයුක්ත කිරීම් සිදු කිරීමට බාධාවක් නොමැත.

**16. විශේෂ රාජකාරි අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම**

පරිපාලනමය හා සේවා අවශ්‍යතා වලදී නිලධරයකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට මෙම අමාත්‍යාංශයේ ලේකම්ට හැකියාව ඇත.

**17. ශ්‍රී.ලං.ග.සේ. නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සිදු කිරීමේ කාලසටහන**

මෙම ස්ථාන මාරු කිරීම් පහත සඳහන් වගුවේ ආකාරයට අදාළ කාල සීමාවන් තුල සිදු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගනු ඇත.

**ස්ථාන මාරු ක්රියාවලියට අදාල කාල සටහන**

| | **කාර්යය** | **දිනය** |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව නාමිකව පිහිටු වීම. | 2022 ඔක්තෝම්බර් මස 31 වන දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | 2022 නොවැම්බර් මස 25 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | 2022 දෙසැම්බර් මස 16 වන දිනට පෙර |
| 04 | අදාළ බලධාරියා* විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | 2023 ජනවාරි මස 06 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා* වෙත ලිඛිතව භාර දීම. | 2023 ජනවාරි මස 13 වන දිනට පෙර |

| | | |
|---|---|---|
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව නාමිකව පත් කිරීම | 2023 ජනවාරි මස 18 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2023 ජනවාරි මස 31 වන දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා* වෙත ලිඛිතව භාර දීම | 2023 පෙබරවාරි මස 15 වන දිනට පෙර |
| 09 | අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | 2023 පෙබරවාරි මස වන 20 දිනට පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම | 2023 මාර්තු මස 15 වන දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | 2023 අප්‍රේල් මස 03 වන දිනට පෙර |
| 12 | සේවා ස්ථාන වලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධරයින් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම | 2023 මැයි මස 03 වන දිනට පෙර |

*සටහන*

**** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්***

## 18. වෙනත් කරුණු

### 18.1 වාර්ෂික ස්ථාන මාරුවීම් පටිපාටියට පරිබාහිර අවස්ථා:

මෙම ස්ථාන මාරුවීම් පටිපාටියට පරිබාහිරව කරන ස්ථාන මාරු ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ /පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමට හේතු වූ කරුණු පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් එම ඉල්ලීම සලකා බලා සුදුසු තීරණයක් ගනු ඇත.

### 18.2 එකම අමාත්‍යාංශයක් තුළ දෙපාර්තමේන්තු අතර මාරු කිරීම

අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු අතර I ශ්‍රේණියේ නිලධරයින් හැර අනෙකුත් නිලධරයින් ස්ථානගත කිරීම් සිදු කිරීමේ බලතල අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට ඇත. එසේ සිදු කළ විටක ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා එවිය යුතු ය.

**18.3 එකම දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාන මාරු කිරීම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ස්ථාන මාරු කිරීම් පිළිබඳ යෝජනා අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම අනුව ස්ථාන මාරු කිරීමක් සිදුකලවිට අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සිදු කළ විටක ඒ බව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා එවිය යුතු ය.

**18.4 නව බඳවාගැනීම් සමග සිදුකරන ස්ථානමාරු**

- නව බඳවාගැනීම්වලදී නිලධරයන් සේවා ස්ථාන ගත කිරීමේ දී දැනට සේවයේ සිටින නිලධාරීන්ට වාර්ෂික නොවන ස්ථාන මාරු ලබාදීමට අවකාශ ඇත.

**18.5 ඉල්ලීම් අඩු සේවා ස්ථාන වල නිලධාරීන්ගේ ස්ථානමාරු**

- දුෂ්කර ප්‍රදේශයන්හි සේවා ස්ථානයන් සහ ස්ථානමාරු ඉල්ලීම් අඩු සේවා ස්ථානයන්වල සේවය කරන නිලධරයන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි වර්ෂ 06 කට වඩා වැඩි කාලයක් සේවය කිරීම පිළිබඳ සළකා බැලිය හැක.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,


එම්.එම්.පී.කේ. මායාදුන්නෙ

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112 - 698672

ෆැක්ස් : 0112 – 693304

විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com

ඇමුණුම I

## ස්ථානමාරු අයදුම්පත - වර්ෂය 2023

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I, II සහ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා

1. පෞද්ගලික තොරතුරු
   - 1.1. නම (පත්වීම් ලිපියේ පරිදි) :..............................................................................................
   - 1.2. නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ :..........................................................................
   - 1.3. සම්පූර්ණ නම :..............................................................................................
     ..............................................................................................
   - 1.4. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................................
   - 1.5. මුල් පත්වීම් දිනය :..............................................................................................
   - 1.6. පෞද්ගලික ලිපිනය :..............................................................................................
     ..............................................................................................
   - 1.7. දුරකථන අංකය :නිවස ................................ ජංගම :..........................................
2. වර්තමාන සේවා ස්ථානය
   - 2.1. අමාත්‍යාංශය/පළාත් සභාව :..............................................................................................
   - 2.2. දෙපාර්තමේන්තුව/පළාත් අමාත්‍යාංශය ..............................................................................................
   - 2.3. කාර්යාලීය ලිපිනය :..............................................................................................
     ..............................................................................................
   - 2.4. කාර්යාලීය දුරකථන අංකය ..............................................................................................
3. තනතුර
   - 3.1. වර්තමාන තනතුරු නාමය :..............................................................................................
   - 3.2. එම තනතුරට පත්වූ දිනය :..............................................................................................
4. ස්ථානමාරු ඉල්ලීමට හේතුව :..............................................................................................

   ..............................................................................................
5. පූර්ව සේවා ස්ථාන :

| තනතුර | සේවා ස්ථානය | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

| | | |
|---|---|---|
| | | |

6. ස්ථානමාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන :

| තනතුර | සේවා ස්ථානය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථානමාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට/එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථානමාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථානමාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය.............                                   අත්සන: ...............

ඇමුණුම **II**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය 2023 වර්ෂය

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව .........................................................

ප්‍රාදේශීය කාර්යාලය/ දිස්ත්‍රික්කය..............................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍යය | තනතුර/ ශ්‍රේණිය | පෞද්ගලික ලිපිනය | උපන්දිනය හා 2022.12.31 දිනට වයස | විවාහක/ අවිවාහක බව<br><br>කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | මාරුවීම් ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය | මාරුවීම් කමිටු තීරණය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

සියළුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම....................................................... අත්සන :..........................

පරීක්ෂා කලේ: නම..................................................... අත්සන :..........................

දිනය...................

..........................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම **III**

1. එක් දිස්ත්‍රික්කයක, එක් සේවා ස්ථානයක අවුරුදු 06කට වඩා කාලයක් හෝ
2. දිස්ත්‍රික්කයක් තුල සමස්ත සේවා කාලය අවුරුදු 12ක් හෝ ඊට වැඩි කාලයක් හෝ
3. චක්‍රලේඛයේ 2.2.2 දැක්වෙන සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හෝ සියළුම නිලධාරීන්ගේ විස්තර මෙහි ඇතුලත් විය යුතු බව සළකන්න. (2022.12.31 දිනට)

(ඉහත 1,2 හා 3 කාණ්ඩ සඳහා වෙන වෙනම ආකෘතිපත්‍ර භාවිතා කලයුතුය.)

(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුලත් විය යුතු බව සළකන්න)

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව ........................................................

පළාත් අමාත්‍යාංශය/ පළාත්දෙපාර්තමේන්තුව/ පළාත් පාලන ආයතනය/ පළාත් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශීය කාර්යාලය ......................................................

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/ මිය/ මෙය යන්න සඳහන් කරන්න | පත්වීම් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2022.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2022.12.31 දිනට | විවාහක/ අවිවාහක බව<br>කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් ගණන/<br>වයස/ ඉගෙනුම ලබන පාසැල් | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කර තිබේද? අයදුම් කර නොමැති නම් ස්ථානමාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සකස් කළේ : නම............................................. අත්සන :.......................... තනතුර..........................

පරීක්ෂා කලේ: නම.......................................... අත්සන :.......................... තනතුර..........................

දිනය..................

.........................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

| |
|---|
| ස්ථාන මාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය.......................................... |

ඇමුණුම **IV**

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය - වර්ෂය 2023</u>**

(අ) නිලධරයා විසින් සම්පූර්ණ කල යුතුය

අමාත්‍යාංශය.................................................
දෙපාර්තමේන්තුව..........................................
01.

i. නිලධරයාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්)
...........................................................................................................................මයා/ මිය/මෙනෙවිය
ii. ස්ථිර ලිපිනය.........................................................................................................................
iii. වර්තමාන පදිංචි ස්ථානයේ ලිපිනය.............................................................................................
iv. 2022 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය..................................
.................................................................................................................................................

02. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථාන..............................................................................................

03. තනතුර හා ශ්‍රේණිය...................................................................................................................
3.1 සේවයට ඇතුලත් වූ දිනය..................................................................................................
3.2 ශ්‍රේණියට ඇතුලත් වූ දිනය................................................................................................

04. උපන්දිනය.............................................................................................................................
2021.12.31 දිනට වයස අවු.................................

| 05. සේවා විස්තර | පත්වූ දිනය | සේවා ස්ථානය - සිට/ දක්වා |
|---|---|---|
| ....................................... | .................................. | .................................................. |
| ....................................... | .................................. | .................................................. |
| ....................................... | .................................. | .................................................. |

06. මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථානමාරුවීම අවලංගු කිරීමටය/ සංශෝධනය කිරීමටය

07. අභියාචනා කිරීමට හේතු (පසුපිටෙහි සඳහන් කරන්න)

08. ස්ථානමාරුව සංශෝධනය කළ යුතු/ ලබාදිය යුතු සේවා ස්ථානය
අමාත්‍යාංශය...................................................................................................................
දෙපාර්තමේන්තුව..............................................................................................................

දිනය........................ ....................................
නිලධරයාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ

i. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ
ii. මෙම ස්ථානමාරුව අවලංගු කිරීම/ සංශෝධනය කිරීම සම්බන්ධයෙන්වන කරුණු දැක්වීම හා නිර්දේශය

දිනය........................

..............................................................................
අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

( අනවශ්‍ය වචන කපාහරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුලත් නොකල අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසු පිටෙහි සඳහන් කරන්න)

ඇමුණුම **V**

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2023</u>**

**- අභියාචක පිළිබඳ තොරතුරු**

**අ. පෞද්ගලික තොරතුරු**

<table>
<tr><td>01. මුලකුරු සමඟ නම:-</td><td colspan="4"></td></tr>
<tr><td>02. තනතුර හා පන්තිය</td><td colspan="4"></td></tr>
<tr><td>03. උපන්දිනය :-YYYY/MM/DD</td><td>04. වයස :-<br>(2022.12.31<br>දිනට)</td><td colspan="2">05. ජාතික හැඳුනුම් පත් අංකය:-</td><td>06. ස්ත්‍රී/පුරුෂ<br>භාවය</td></tr>
<tr><td>07.ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:<br>දිස්ත්‍රික්කය:</td><td>08. තාවකාලික<br>ලිපිනය:-</td><td colspan="3">09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :-</td></tr>
<tr><td>10. විවාහක /අවිවාහක බව</td><td>11. කලත්‍රයාගේ<br>නම:-</td><td colspan="3">12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:-</td></tr>
<tr><td>13. දරුවන් ගණන</td><td>14. ඔවුන්ගේ වයස:-</td><td colspan="3">15. ඉගෙනුම ලබන පාසැල්:-</td></tr>
</table>

**ආ. සේවා තොරතුරු**

<table>
<tr><td colspan="2">16. තනතුරට පත් වූ දිනය:-</td></tr>
<tr><td>17.වර්තමාන සේවා ස්ථානය :-</td><td>18.සේවා ස්ථානය පිහිටි නගරය:-</td></tr>
<tr><td>19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br>YYYY/MM/DD</td><td>20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2022.12.31 දිනට)<br>අවු........... මාස.......... දින.......</td></tr>
</table>

| |
|---|
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? |

| **22.** රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | **1** | | | සිට | දක්වා |
| | **2** | | | | |
| | **3** | | | | |
| | **4** | | | | |
| | **5** | | | | |
| | **6** | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )

| **23** .වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය : - | | | |
| ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධාරියා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී) **: -** | | | |
| ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන **: -** | | | |

**24.** නිලධාරියා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද **: -**

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**25**. ඉහත අංක 24 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ **: -**

(ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බව ද සඳහන් කරන්න)

**ඈ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු : -**

| | | |
|---|---|---|
| **26.** ස්ථානමාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

| | | | |
|---|---|---|---|
| 27. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන | |
| ස්ථාන මාරු සංශෝධනය කිරීම | | **1** | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | **2** | |
| | | **3** | |

28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :-

**ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු :-**

29. ස්ථාන මාරු සමාලෝචක කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3 ..........................................................................................................................................

30. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම **(01)** ..........................................................................................................

ඇමුණුම **(02)** ..........................................................................................................

ඇමුණුම **(03)** ..........................................................................................................

31. ඉල්ලා සිටිනු ලබන සහන

**1.** ..........................................................................................................................................

**2.** ..........................................................................................................................................

3. ..........................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

........................................ ................................................

දිනය අත්සන

**ඊ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

නිලධාරියා/නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. ................... වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

**i.** ..........................................................................................................................

**ii.** ..........................................................................................................................

**iii.** ..........................................................................................................................

....................................... ................................................

දිනය අත්සන

**උ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය**

| | |
|---|---|
| **I.** | ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන: ........................................................................ |
| **II.** | අභියාචනය පිළිබඳ නිර්දේශය: .................................................................................................. |
| | ............................................................................................................................................ |
| | ............................................................................................................................................ |
| | ............................................................................................................................................ |

........................................ ..................................................

දිනය අත්සන

ඇමුණුම **VI**

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - වර්ෂය 2023</u>**

**- අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු**

I. අභියාචක නිලධාරයාගේ නම හා තනතුර**:**

.........................................................................................................

II. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම:- | | | |
| 02. තනතුර හා පන්තිය | | | |
| 03. උපන්දිනය :-YYYY/MM/DD | 04. වයස :- (2022.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම් පත් අංකය:- | 06. ස්ත්‍රී/පුරුෂ භාවය |
| 07.ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:<br><br>දිස්ත්‍රික්කය: | 08. තාවකාලික ලිපිනය:- | 09. දුරකථන අංකය<br><br>කාර්යාලය :-<br><br>පෞද්ගලික :- | |
| 10. විවාහක /අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- | |

**ආ. සේවා තොරතුරු**

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17.වර්තමාන සේවා ස්ථානය :- | 18.සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br><br>YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2022.12.31 දිනට)<br><br>අවු........... මාස.......... දින....... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )

| 23 .වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය : - | | | |
| ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධාරියා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී) : - | | | |
| ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන :- | | | |

24. නිලධාරියා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| | | |
| | | |

| 25. ඉහත අංක 24 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂක ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ:-<br>( ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බවද සඳහන් කරන්න) |
|---|

**ඇ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු:-**

| | | |
|---|---|---|
| 26. ස්ථානමාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

| | | | |
|---|---|---|---|
| 27. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන | |
| ස්ථාන මාරුව සංශෝධනය කිරීම | | **1** | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | **2** | |
| | | **3** | |

| |
|---|
| 28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- |

**ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු :-**

| |
|---|
| 29. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේද /නැද්ද යන්න |

| |
|---|
| 30. අභියාචකගේ ඉල්ලීම ඉටු කිරීමට ඇති හැකියාව පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය:- |

.......................................... ..................................................

දිනය අත්සන

ඇමුණුම **VII**

නම :- ……………………………………..................

සේවා ස්ථානය :- ………………………………………

දිනය :- ……………………………………..................

…………………………………….. මගින්,

…………………………………….. මගින්,

ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**<u>නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීම.</u>**

………… (වසර) වසරේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව…………………. (මුදා හරින ලද දිනය) දින සිට සේවයෙන් මුදා හරින ලද මා……………………. (සේවය වාර්තා කළ දිනය) දින………………………………………………… (සේවා ස්ථානය) සේවයට වාර්තා කළ බව කාරුණිකව දන්වමි.

මෙයට විශ්වාසී,

අත්සන :- …………………………………....

සේවය :- …………………………………........

ශ්‍රේණිය :- …………………………………......

ජාතික හැඳුනුම්පත් අංකය:- …………………………………........

සේවයට වාර්තා කළ බව තහවුරු කරමි.

…………………………………....... …………………………………......

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

පිටපත්:

ඇමුණුම **VIII**

මගේ අංකය :- ……………………………….................

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව :- ……………………………….................

දිනය :- ……………………………….................

…………………………………….. මඟින්,

…………………………………….. මඟින්,

…………………………………………………….. මහතා/ මිය/ මෙය,

තනතුර:- ………………………………..........

**<u>වාර්ෂික ස්ථාන මාරු ලැබීම මත සේවයෙන් මුදා හැරීම.</u>**

………… (වසර) වසරේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඉහත නම් සඳහන් නිලධාරියා/ නිලධාරිණිය ……………………… (නව සේවා ස්ථානය) වෙත සේවයට වාර්තා කළ හැකි වන පරිදි ………………………………………………… (මුදා හරිනු ලබන දිනය) දින සිට සේවයෙන් මුදා හරින බව කාරුණිකව දන්වමි.

……………………………….................

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

පිටපත්:

ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය